# හැඳින්වීම

'සාමය හා සංහිඳියාව වෙත යොමු වූ සමාජ සංවාද' ලිපි පෙළ සකස් කිරීමේ දී අප ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළේ විවිධත්වයකින් අලංකෘත වූ ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සුහදත්වය හා සාමුහිකත්වය ගොඩ නැගීමේ උතුම් අරමුණ කෙරෙහිය.

විවිධ ජන වාර්ගික, ආගමික සහ සංස්කෘතික උරුමයන්ගෙන් පෝෂිත වූ අප සමාජය, සාමයේ හා සංහිඳියාවේ මාවතේ අඛණ්ඩව ගමන් කිරීමට නම් සියලූ පාර්ශවයන් අතරේ අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් ව පවතී. අන්‍යෝන්‍ය අවබෝධය නොමැති විට එකිනෙකා පිළිබඳ සැකය, අවිශ්වාසය, බිය වැනි හානිකර ප්‍රවනතාවන් ගොඩ නැගෙන්නට ඇති ඉඩකඩ බහුලය. කිසිඳු දහමක් මෙවන් වියවුල් සමාජ තත්ත්වයන් අනුමත නොකරයි. එබැවින් සංවාදී සමාජ සම්බන්ධතාවක් මගින් අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කොට සමාජ සාමුහිකත්වය ගොඩ නැගීම යුගයේ අවශ්‍යතාවයක් ව පවතී.

එක් එක් දහම් හි වත් පිළිවෙත්, චර්යාවන් මෙන්ම සංස්කෘතික පැතිකඩයන් පිළිබඳව අප සියලූ දෙනාම අවබෝධයක් ලබා ගැනීමේ ප්‍රයත්නයක නිරත වීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස දකින්නෙමු. එමෙන්ම සමාජ සංහිඳියාව ශක්තිමත් පදනමකින් ගොඩ නගන්නට නම් සෑම දහමක්ම එම දහමේ වැදගත් ඉගැන්වීම් පිළිබඳව අන් ආගමිකයින් දැනුවත් කිරීම ද වැදගත් වේ.

ඉස්ලාම් දහම මෙන්ම මුස්ලිම් සමාජය පිළිබඳව ද විවිධ වැරදි මත ඇති වී තිබෙන බව අපි ඉතා නිහතමානීව පිළිගන්නෙමු. එම වැරදි මතයන් ගැන කරුණු පහදා දී සත්‍ය තත්ත්වය අවබෝධ කර දීමේ වගකීම අප විසින් අතපසු කොට ඇති බව ද පිළිගන්නෙමු. ප්‍රමාද වී හෝ එම භාරධූර කාර්ය පිළිබඳව යමක් කිරීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකන්නෙමු.

මෙය සාධනීය සංවාදයක් සඳහා වූ දොරටු විවෘත කිරීමක් පදනම් කරගත් ලිපි පෙළක් හෙයින් මෙහි අන්තර්ගතයේ ඇති කරුණු පිළිබඳව ඔබගේ අවංක අදහස් දැක්වීම් අපි ඉතා අගය කොට සලකන්නෙමු.

විසංවාදී නොවී සංවාදී සමාජයක් තුළ සියලූ කරුණු සාමකාමීව විසඳා ගැනීමට අධිෂ්ඨානශීලීව ක්‍රියා කරන්නට ලක් මවගේ සියලූ දරුවන් වන අපි එකට අත්වැල් බැඳ ගනිමු. සෞභාග්‍යයෙන් පිරි සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට අපගේ පූර්ණ දායකත්වය ලබා දෙමු.

**සැකසුම**


මව්ලවි මුර්ෂිඩ් මුලෆ්ෆර්
මව්ලවි මාහිර් රම්ඩීන්
මව්ලවි ඉර්ෂාද් හිල්මි
මව්ලවි නූමාන් ඔමාර්

සහෝදර මොහොමඩ් දහලන්
සහෝදර අයාස් සාලිහ්

ඊ-මේල්: teamunityhub@gmail.com
විමසුම් සඳහා: +94 783 330 004, +94 722 009 002
අමතර පිටපත් සඳහා: +94 778 451 919, +94 779 481 919, +94 779 741 919
අන්තර්ජාල: www.unityhub.org

# අන්තර්ගතය


- මුස්ලිම්වරුන් 10%කට පල්ලි 6300 ක් අවශ්‍ය ද ?
- දහමක සමාජ මෙහෙවර
- ආගමික මධ්‍යස්ථානයක අවශ්‍යතාව
- ඉස්ලාමීය ආගමික මධ්‍යස්ථානය
  - මස්ජිදය නැමදුම් ස්ථානයකි
    - සලාතය
    - සිකුරාදා දින ජුමුආ දේශනය හා සලාතය
    - මෘත දේහය සඳහා වූ ජනාසාZ  සලාතය
    - හජ් හා රමළාන් උත්සව සලාතය
  - මස්ජිදය සමාජීය සංස්කෘතික හා අධ්‍යාපනික මධ්‍යස්ථානයකි
    - සමාජ හා සංස්කෘතික කටයුතු
    - අධ්‍යාපනික කටයුතු
- මස්ජිදය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන
  - මුස්ලිම් පල්ලි හා පුණ්‍යාහාර හෝ වක්ෆ් පනත
  - මස්ජිද් නිර්මාණය
  - මස්ජිද් පරිපාලනය
- මස්ජිදය හා මුස්ලිම් සමාජය
- ආගමික ස්ථාන පිළිබඳ ආගමික මතයන්
  - ඉස්ලාමීය ඉගැන්වීම්
  - බෞද්ධ ඉගැන්වීම්
- සමාප්තිය

**ප්‍රශ්නය: මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතාවට වඩා වැඩි මුස්ලිම් පල්ලි (මස්ජිද්) ප්‍රමාණයක් නිර්මාණය කොට තිබේ. මෙසේ කරනුයේ අනෙකුත් දහම් අභිභවා පෙරමුණ ගන්නට අදහස් කරන නිසා ද?**

## පැහැදිලි කිරීම

### මුස්ලිම්වරුන් 10%කට පල්ලි 6300 ක් අවශ්‍ය ද?

"බෞද්ධයන් 71% ක් සිටින රටේ පන්සල් ඇත්තේ 9800 ක් පමණ නමුත් මරක්කලයින් 10%කට පල්ලි 6300ක් ඇතැයි කියනු ද අසන්නට ලැබෙයි"

ඉහතින් උපුටා දැක්වූයේ මුස්ලිම්වරුන්ට එරෙහිව සමාජයේ පැතිරෙමින් පවතින අභූත චෝදනාවකි. මෙවැන් කරුණු ලියන්නට පෙර සත්‍යය තොරතුරු විමසා බැලීම කාගේත් දැඩි වගකීමකි. නමුත් සත්‍යය පිළිබඳව කිසිම තැකීමකින් තොරව මෙවන් පදනම් විරහිත අසත්‍ය කරුණු ඉදිරිපත් කිරීම කිසිම දහමක් අනුමත කරන ක්‍රියාවක් නොවන බව පවසන්නට කැමැත්තෙමු. මුස්ලිම් පල්ලි පිළිබඳව කටයුතු කරන රාජ්‍යය ආයතන දෙක නම් "වක්ෆ් පුණ්‍යභාර මණ්ඩලය" හා "මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුව"යි. ඔවුන්ගෙන් ලද තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ ලියා පදිංචිව ඇත්තේ මුස්ලිම් පල්ලි දෙදහස් දෙසියයකට අඩු ප්‍රමාණයකි. මෙයට අමතරව අනෙකුත් දහම් හි ලියා පදිංචි නොවූ ආගමික ස්ථාන තිබෙන්නාක් මෙන් ලියා පදිංචි නොවූ මුස්ලිම් පල්ලි සුළු ප්‍රමාණයක් ද නැතැයි ප්‍රතික්ෂේප කිරීමට අප සූදානම් නැත.

මුස්ලිම්වරුන්ට සමාජ සංස්කෘතික හා ආගමික කටයුතු සිදු කිරීමට මස්ජිදයන්හි අවශ්‍යතාව තිබුණ ද ඉහත චෝදනාව අනුව ශ්‍රී ලංකාවේ මුස්ලිම් පල්ලි 6300 ක් නොමැති බව ඉතා වගකීමෙන් යුතුව පවසා සිටින්නෙමු.

### දහමක සමාජ මෙහෙවර

සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නගා එහි සාරධර්ම ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම සෑම දහමකටම පැවරී ඇති අති වැදගත් සමාජ වගකීමක් වන්නේය.

ගූගල් (google) වෙබ් අඩවියෙහි සෙක්ස් (sex) යන වචනය සෙවීමේ ලෝකයේ පළමු වැනි තැන අඛණ්ඩව දෙවසරක්ම අප රට ලබා ගෙන ඇත. ඒක පුද්ගල මත්පැන් පරිභෝජනය හා සියදිවි නසා ගැනීමේ වාර්තා අනුව අපි ලෝකයේ හතර වැනි ස්ථානය ලබා ගෙන සිටින්නෙමු. ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, සමීප ඥාතී ලිංගික අපචාර (ව්‍යාභිචාරය), මිනී මැරුම්, සාපරාධී ගබ්සා ආදී කටයුතු සම්බන්ධව ලෝක වාර්තා තැබීමේ තරඟයට ද අවතීර්ණ වී සිටින්නෙමු.

මෙවන් සාපරාධී හා සදාචාර විරෝධී ක්‍රියාවන් හි වර්ධනය අපට හඬ නගා කියන්නේ කුමක් ද? සියලු දහම් තම වගකීම් හා මෙහෙවර ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව නොවේ ද?

ස්ත්‍රී දූෂණ හා මිනී මැරුම් දිගින් දිගට සිදු වූ එක්තරා ප්‍රදේශයක මෙවන් සදාචාර විරෝධී සාපරාධී සිදුවීම් වලට බල පෑ සමාජ විද්‍යාත්මක සාධක පිළිබඳව පර්යේෂණයක් පවත්වා වාර්තාවක් සපයන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයෙන් ඉල්ලීමක් කරන ලදී.

එම පර්යේෂණයෙන් හෙළි දරව් වූ වැදගත් ම සාධකය වූයේ එම ප්‍රදේශයේ තිබූ විහාරස්ථානයේ වැඩ විසූ නායක ස්වාමීන් වහන්සේ අපවත් වූවායින් පසු ප්‍රදේශ වාසීන් හා විහාරස්ථානය අතර සබඳතාවයන් හි බරපතල බිඳ වැටීමක් ඇති වී ජනයා දහමෙන් දුරස්ථ වී කටයුතු කිරීමට ඉදිරිපත් වීම මෙවන් සාපරාධී ක්‍රියාවන්ට හේතු වූ බවය.

සමස්ත ජනගහනයෙන් මුස්ලිම්වරුන් 9%ක් වුව ද සමස්ත බන්ධනාගාර රැඳවියන්ගෙන් 20%ක් පමණ මුස්ලිම්වරුන් වීම විශාල සමාජ ගැටළුවක් අප අතර මතු කොට ඇත.

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ ආගමික මධ්‍යස්ථානයක් තිබීම වැදගත් වනවා මෙන්ම එම මධ්‍යස්ථානය ප්‍රදේශයේ ජනයා සමග සමීප සබඳතා ගොඩ නගා ගෙන සාරධර්ම ප්‍රවර්ධනය සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමේ වැදගත් කමය. ආගමික මධ්‍යස්ථානයක් තිබියදීත් මෙවන් අවාසනාවන්ත තත්ත්වයන් උදාවන්නේ නම් ආගමික මධ්‍යස්ථානයන් නොතිබුණා නම් තත්ත්වය කෙතරම් භයානක විය හැකි ද යන්න කරුණාකර සිතා බලන්න.

## ආගමික මධ්‍යස්ථානයක අවශ්‍යතාව

සෑම දහමකම එම දහමේ කටයුතු සඳහා ආගමික ස්ථාන පිහිටුවා තිබීම අප පොදුවේ දකින තත්ත්වයකි. නැමදුම් ඉටු කිරීම, ආගමික දේශනා පැවැත්වීම, ආගමික අධ්‍යාපන කටයුතු කරගෙන යෑම මෙන්ම සමාජ හා සංස්කෘතික කටයුතු ඉටු කිරීම වැනි මිනිසාගේ යහපත උදෙසා කරන්නා වූ ක්‍රියාවන් සඳහා මෙම ආගමික ස්ථාන උපයෝගී වන බව අපි දැක ඇත්තෙමු. එක් ජනාවාස ප්‍රදේශයක ආගමික මධ්‍යස්ථානයක් නොමැති වූ විටක එම ප්‍රදේශයේ ජනයාගේ මෙම ක්‍රියාකාරකම් නිසි අයුරින් ඉටු කිරීමට විශාල බාධාවන් ඇති වන අතර ජනයාගේ ආධ්‍යාත්මික හා සාරධර්ම වර්ධනයට විශාල ගැටළුවක් ඇති වීමට තිබෙන්නා වූ ඉඩකඩ අති මහත්ය. ඉහතින් සඳහන් කළ පරිදි මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, කොල්ලකෑම් වැනි සමාජ විරෝධි ක්‍රියා බහුලව පැවති ප්‍රදේශයන් හි කළ ගවේශණයන් අනුව හෙළිදරව් වී ඇති වැදගත් සත්‍යයක් නම් එම ප්‍රදේශයන් හි ආධ්‍යාත්මික හා සාරධර්ම වර්ධනය සඳහා වූ ආගමික ස්ථාන නොතිබීම හෝ තිබූ ආගමික ස්ථාන හා ප්‍රදේශවාසීන් සමග බැඳියාවක් නොතිබූ බවය. මෙම සමාජ සත්‍යය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී සදාචාරාත්මක සමාජයක්



අපේක්ෂා කරන සැමගෙන් සිදු විය යුත්තේ ආගමික ස්ථාන පිළිබඳ ව පදනම් විරහිත විරෝධතාවන් මතු කරනවාට වඩා අවංක ලෙසම ඒ පිළිබඳව ධනාත්මක දැක්මක් ඇති කර ගැනීම නොවේ ද? මෙම සාධාරණ හේතු පදනම් කරගෙන සෑම ජනාවාස ප්‍රදේශයකම සියලු දහම් හි ආගමික මධ්‍යස්ථාන තිබීම ජනයාගේ යහපත පිණිසමය යන මූලික සිද්ධාන්තය පිළිගැනීමට කිසිවෙකුට දුෂ්කරතාවක් ඇතැයි අපි නොසිතන්නෙමු.

## ඉස්ලාමීය ආගමික මධ්‍යස්ථානය

ඉස්ලාමීය ආගමික ස්ථානයන් වන මුස්ලිම් පල්ලි 'මස්ජිද්' යන නමින් හැඳින් වේ. දෛනිකව පස්වේලක් අනිවාර්යයෙන් ඉටු කළ යුතු නැමදුමට 'සලාතය' යනුවෙන් කියනු ලැබේ. එම සලාතයේ ඉරියව්වක් වන දණින් වැටී නළල බිම තබා කරන 'සුජූද්' යන ඉරියව්ව පදනම් කර ගෙන මෙයට 'මස්ජිද්' යන නම ලැබී ඇත. මස්ජිදයේ මූලික අරමුණු පහත සඳහන් අයුරින් නිර්වචනය කළ හැක.

**"මස්ජිදයක මූලික අරමුණු ලෙස අදාළ මුස්ලිම් ජන සමූහයේ ආගමික, සමාජ, සංස්කෘතික, ආධ්‍යාත්මික හා අධ්‍යාපනික කටයුතු පිළිබඳ අභිවෘධිය උදෙසා උපකාරී වීම හා ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඉස්ලාම් දහම සුරැකීම ලෙස දැක්විය හැක"**

### මස්ජිදය නැමදුම් ස්ථානයකි

### සලාතය

සෑම මුස්ලිම් වරයෙකුටම දෛනිකව පස් වතාවක් සලාතය ඉටු කිරීම අනිවාර්යය වගකීමක් වන්නේය. සලාතය තනිව ඉටු කරනවාට වඩා මස්ජිදයේ සාමූහිකව ඉටු කළහොත් 27 වාරයක අධික කුසල් අත්වන බව ඉස්ලාමය උගන්වයි. මෙම සාමුහිකත්ව හමු වීම මගින් ප්‍රදේශවාසීන් අතර ශක්තිමත් සහෝදරත්ව බැඳියාවක්, සුහදත්වයක් හා අන්‍යෝන්‍ය අවබෝධයක් වර්ධනය කර ගැනීමට අවස්ථාවක් උදා වන්නේය. සමාජ යහ පැවැත්මට අත්‍යවශ්‍ය සාමුහිකත්වය ගොඩ නැගීම සඳහා සාමූහික සලාතයෙන් ලැබෙන ශ්‍රේෂ්ඨ දායකත්වය කාට නම් ප්‍රතික්ෂේප කළ හැක්කේ දැයි අසන්නට කැමැත්තෙමු.



අනිවාර්ය වූ පස් වේල සලාතය මස්ජිදයේ ඉටුකරන අයුරු

මෙම සලාතයන් අතුරින් අලුයම 4.30 ට පමණ 'ෆජ්ර්' සලාතය ද රාත්‍රී 8.00 ට පමණ 'ඉෂා' සලාතය ද ඉටු කළ යුතු ව ඇත. තම ප්‍රදේශයේ දුරස්ථ තැනක ප්‍රධාන මස්ජිදය පිහිටා ඇති විට අලුයම හා රාත්‍රී කාලයන් හි මෙම



අතීතයේ උස් තැනක සිට අසාZන් කැඳවුම කරන අයුරු සිතුවමකින්

සලාතයන් සාමූහිකව ඉටු කිරීම සඳහා යෑම දුෂ්කර කරුණකි. මෙම හේතූන් මෙන්ම වයෝවෘධ හා රෝගී තත්ත්වයේ පසුවන්නන්ගේ පහසුව මූලික වශයෙන් සැලකිල්ලට ගෙන යම් ප්‍රදේශයක කුඩා ජන සමූහයක් පදනම් කර ගෙන නිසි රාජ්‍ය අනුමැතිය ලබා කුඩා මස්ජිදයන් සාදා ගැනීම සිදු වේ. මෙලෙස කුඩා මස්ජිදයන් සාදා ගැනීමේ ක්‍රියාවලිය පිටුපස ඉහත සඳහන් කාරණා හැර වෙනත් කිසිඳු වැරදි පරමාර්ථයක් නොමැති බව අවධාරණයෙන් පවසන්නට කැමැත්තෙමු.

මස්ජිදය පිහිටා ඇති ස්ථානයට සාපේක්ෂව දුරස්ථ භූමි භාගයක එම ප්‍රදේශයේ මුස්ලිම් ජනයා විසිරී ජීවත් වන්නේ නම් මෙම මස්ජිදයන්හි පස්වේල සලාතය සඳහා ‘අසාZන්’ නම් කැඳවුම වෙනුවෙන් විනාඩි තුනක් වැනි කෙටි කාලයක් තුළ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කර ගැනීම ද දක්නට ඇත. මෙමගින් සලාතය ඉටු කළ යුතු වේලාවන් නිවැරදිව දැන ගැනීමට සැමට අවස්ථාව උදා වේ.

## සිකුරාදා දින ජුමුආ දේශනය හා සලාතය

සෑම සිකුරාදාවක ම ජුමුආ නැමදුම සඳහා අවට කුඩා මස්ජිදයන් හි පස්වේල සලාතය ඉටු කරන්නන් සැවොම ප්‍රදේශයේ එක් ප්‍රධාන මස්ජිදයකට රැස් වේ. මෙම නැමදුම අනිවාර්යයෙන්ම සාමූහිකව හැර ඉටු කළ නොහැක. මිලියන දෙකක් පමණ වන ලාංකේය මුස්ලිම් ජනයාගෙන් අවම වශයෙන් වැඩිවියට පත් පිරිමි මිලියනයක ප්‍රමාණයක් අනිවාර්යයෙන්ම එක්වර එකම වේලාවක සිකුරාදා දින මේ නැමදුම සඳහා සහභාගි වන හෙයින් විශාල ඉඩකඩ ප්‍රමාණයක් ඇති විශාල මස්ජිදයන් හි අවශ්‍යතාව මතු වන බව පිළිගැනීමට දුෂ්කරතාවක් කෙසේ නම් තිබිය හැකි වන්නේ ද? ඇතැම් මස්ජිදයන් හි මෙම අනිවාර්යය නැමදුම සඳහා ඇතුළත ඉඩකඩ ප්‍රමාණවත් නොවන හෙයින් මස්ජිදයට පිටතත් ජනයා නැමදුමෙහි නිරත වීම අපට දකින්නට ලැබෙන සුලභ දර්ශනයකි. මෙය ද අපට හඬ නගා පවසන්නේ සමහර ප්‍රදේශයන් හි මස්ජිදයන් හි ඉඩකඩ ප්‍රමාණවත් අයුරින් නොමැති බව නොවේ ද?



ජුමුආ දේශනය පවත්වන අයුරු



සිකුරාදා ජුමුආ සලාතය දැඩි සෙනග හේතුවෙන් මස්ජිදයෙන් බාහිරව ඉටු කරන අයුරු

ජුමුආ නැමදුමෙහි ප්‍රධාන අංගයක් ලෙස ප්‍රදේශ වාසීන්ට ආගමික දේශනයක් පවත්වනු ලැබේ. සිංහල භාෂා නිපුණත්වයක් ඇති ආගමික විද්වතුන් මෙම දේශනය සිංහලෙන් පවත්වති. මෙම දේශනයන්ට සවන් දීමට කැමැත්තක් දක්වන්නේ නම්

කරුණාකර අපව අමතන්න. යම් හෙයකින් දමිළ බසින් මෙම දේශනය සිදු කරන්නේ නම් එය සිංහල බසට පරිවර්ථනය කරන්නට පහසු කම් සලසා දිය හැක. මෙම කටයුතු සියල්ල සම්පූර්ණ විනිවිද භාවයකින් සිදු කරන අතර මෙම දේශනා මගින් සමාජයට හෝ සමාජ සංහිඳියාවට හානි කර කිසිවක් සිදු නොකරන බව අවධාරණයෙන් පවසන්නට කැමැත්තෙමු.

## මෘත දේහය සඳහා වූ ජනාසාz සලාතය



ජනාසාz සලාතය මස්ජිදයේ ඉටු කරන ඡායා රූපයක්

මුස්ලිම් වරයෙකුගේ මෘත දේහයක් වළ දැමීමට පෙර කළ යුතු වගකීම් අතුරින් ''ජනාසාz සලාතය'' නමින් හැඳින්වෙන මෘත දේහය සඳහා වූ සලාතය ඉටු කළ යුතුව ඇත. මෙවන් අවස්ථාවක දී අවට ගම් වැසියන් පමණක් නොව පිට ගම් හි නෑහිතවතුන් ද සහභාගී වන හෙයින් මේ සඳහා ද විශාල ඉඩකඩක් ඇති මස්ජිදයක අවශ්‍යතාව මතු වේ.

## හජ් හා රමළාන් උත්සව සලාතය



මස්ජිදයන්ට අමතරව ගාලු මුවදොර පිටියේ පැවැත්වෙන උත්සව සලාතයට සහභාගී වන ජනකාය

ලෝ වැසි මුස්ලිම්වරුන් රමළාන් උපවාස මාසය අවසන් වීම සමගත් හජ් මාසයේ 10 වැනි දිනත් වර්ෂයකට දෙවතාවක් උත්සවයන් පවත්වති. මෙම උත්සවයන්ට අදාළ සලාතය ද ප්‍රදේශයේ සියල්ලන්ට එකවර එකට රැස්විය හැකි ආකාරයේ විශාල මස්ජිදයන් හි සිදු කරනු ලැබේ. උත්සව සලාතය සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය මෙන්ම කුඩා දරුවන් ද මෙම සලාතය සඳහා මස්ජිදයක සහභාගී වන්නේ නම් මිලියන දෙකක පිරිසකට එක්වර එකම වේලාවක රැස්වීමට පහසුකම් ඇති විශාල මස්ජිදයන් හි අවශ්‍යතා ව මතු වේ.

රමළාන් මාසයේ බොහෝ ක්‍රියාකාරකම් මස්ජිදය මුල් කරගෙන සිදු වේ. රමළාන් උපවාසය සාමූහිකව පවාරණය කිරීම, විශේෂිත රාත්‍රී සලාතයන් සාමූහිකව ඉටු කිරීම මෙන්ම මෙම මාසයේ අවසන් දින දහයේ 'ඉඃතිකාෆ්' නම් වූ මස්ජිදයේම රැඳී ආගමික වතාවත් හි නියැලීම ආදි කටයුතු මෙහි දි සිදු කරනු ලැබේ.

ඉහත සඳහන් ආගමික වගකීම් ඉටු කිරීමට මුස්ලිම්වරුන්ට ප්‍රමාණවත් මස්ජිදයක් හැර වෙනත් කිසිඳු විකල්පයක් නොමැත. කරුණාකර සිතා බලන්න. පදනම් විරහිත ලෙස ආගමික ස්ථාන පිළිබඳව විරෝධතා දක්වනවාට වඩා අවශ්‍ය ව ඇත්තේ සත්‍යය අවබෝධ කරගෙන යථාර්ථවාදීව කටයුතු කිරීම නොවේ ද?

# මස්ජිදය සමාජ, සංස්කෘතික හා අධ්‍යාපනික මධ්‍යස්ථානයකි

අනෙකුත් දහම් හි ආගමික මධ්‍යස්ථානයන් මෙන් මස්ජිදයෙහි නැමදුම් කටයුතු වලට අමතරව මුස්ලිම් වරයෙකුගේ ජීවිතයේ සමාජයීය, සංස්කෘතික හා අධ්‍යාපනික කටයුතු සඳහා විශාල කාර්ය භාරයක් ඉටු වේ.

## සමාජ හා සංස්කෘතික කටයුතු

'නිකාහ්' යනුවෙන් හැඳින්වෙන ඉස්ලාමීය විවාහ ගිවිසුම් කටයුතු මස්ජිදයේ ඉටු කරනු ලැබේ. 'සZකාත්, සදකා හා සZකාතුල් ෆිත්ර් වැනි පුණ්‍ය දීමනා කටයුතු මස්ජිදය මුල් කරගෙන බොහෝ තැන්වල සිදු කෙරේ. විවිධ පුද්ගල හා සමාජ ප්‍රශ්නයන් ඇති වූ විට ගැටුම් නිරාකරණ මධ්‍යස්ථානයක් ලෙස ද මස්ජිදය යොදා ගනියි. සහනාධාර බෙදා හැරීම, ලේ දන්දීමේ කඳවුරු, විවිධ ශාසනික කටයුතු, ශ්‍රමදාන කඳවුරු, විශේෂ නිවේදනයන් නිකුත් කිරීම ආදිය මස්ජිදය මුල් කරගෙන සිදු වේ.



පල්ලියේ පැවැත්වෙන නිකාහ් නමැති විවාහ ගිවිස ගැනීම

පල්ලිය හුදෙක් මුස්ලිම් වරුන්ගේ නැමදුම් ස්ථානයකට වඩා මුළු මහත් සමාජයේම යහපත අරමුණු කොට ගෙන ක්‍රියා කරන ජනතා මධ්‍යස්ථානයක් බව මෙම කරුණු අනුව පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු. සමාජ යහපත උදෙසා ක්‍රියා කරන මෙවන් ආගමික මධ්‍යස්ථාන පිළිබඳව පදනම් විරහිත ලෙස චෝදනා නගමින් ක්‍රියා කිරීම සත්‍යය වශයෙන්ම දැනට අධි වේගයෙන් පිරිහෙමින් පවතින සමාජ සදාචාරය සහමුලින්ම විනාශ කර දැමීමට කරන ක්‍රියාවක් නොවන්නේ ද?

## අධ්‍යාපනික කටයුතු

සමාජය තුළ සාරධර්ම බිඳ වැටීම දැඩිව තේරුම් ගෙන දරුවන් ඉරිදා හා පොහොය දිනයන් හි දහම් පාසල් තුළ රඳවා ගැනීම පිණිස පෞද්ගලික පන්ති (ටියුෂන් පන්ති) තහනම් කරන තත්ත්වයකට අද සමාජය පත්ව ඇත්තේ සාරධර්ම ගොඩ නැගීම පොතේ පතේ අධ්‍යාපනය මෙන්ම වැදගත් වන බව වටහා ගෙන නොවේ ද?



එමෙන්ම පිරිසිදුකම, නැමදුම් පිළිවෙත්, ඇඳුම්, ආහාර, විවාහ ජීවිතය, ඥාති සබඳතාවන් හා සහජීවනය ආදී ජීවිතයේ මූලික කරුණු පිළිබඳව සෑම මුස්ලිම් වරයෙකුම දැනගත යුතු වේ. මේවා අරමුණු කොට ගෙන වයස අවුරුදු 5-10 අතර දරුවන් සඳහා දහම් පාසල් සතියේ දිනවල මස්ජිදයේ

පැවැත් වේ. මෙම දහම් පාසල් ඇතැම් උදවිය **'මක්තබ්'** යනුවෙන් හඳුන්වති. අන් දහම් හි සති අන්ත දහම් පාසල් පවත්වන අයුරින්ම කුඩා දරුවන් සඳහා වූ මෙම දහම් පාසල දෛනිකව පැයක හෝ පැය 1 1/2ක කාලයක් තුළ පැවැත් වේ. ඉස්ලාමීය මූලාශ්‍ර සියල්ල අරාබි භාෂාවෙන් ඇති හෙයින් හා සලාතය හා බොහෝ ආගමික කටයුතු අරාබි භාෂාවෙන් ඉටු කරන හෙයින් මෙම දහම් පාසල්වල මූලික අරාබි භාෂා දැනුම ද ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් 1969 දී 'ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය' පිළිබඳව පැවැත් වූ ශත සංවත්සරය සැමරීම උදෙසා ''ක්‍රි:පූ 8 වන සියවසේ සිට එම වසර දක්වා ලංකාවේ අධ්‍යාපනය'' යන තේමාව යටතේ පළ කරන ලද ප්‍රකාශනයේ ලිපියකින් පහත සඳහන් කොටස සංක්ෂිප්තව ගෙන හැර දක්වන්නට කැමැත්තෙමු.

"සිංහල රජ දරුවන්ගේ කාලයේ සිට පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි පාලන සමයේ දීත් අඛණ්ඩව වර්තමානය දක්වා 'මක්තබ්' නමින් මුස්ලිම් පල්ලි හා බැඳුනු ඉස්ලාමීය දහම් පාසල් පැවති බව සඳහන් වී ඇත."

එම ලිපියේ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඒ. ජේ. ආ(ර්)බරී විසින් 'මක්තබ්' සංකල්පය නිර්වචනය කොට ඇති ආකාරය පහතින් ඉංග්‍රීසි බසින් දී ඇති අතර එහි පරිවර්තනය එයට පහතින් දී ඇත්තෙමු.

**Professor A.J. Arberry of Cambridge**
The maktab has been defined as "a primary school often attached to a mosque, the chief business of which is to instruct boys (and girls) in those portions of the Koran which a Mohammedan is expected to know by heart in order to perform his devotions and other religious functions. Sometimes instruction in reading, writing and simple arithmetic was also included in the curriculum."

"මුහම්මදිකයෙකුට (ඉස්ලාමිකයෙකුට) තමාගේ නැමදුම් හා අනෙකුත් ආගමික ක්‍රියාවන් ඉටු කිරීම පිණිස අල් කුරානයෙන් වනපොත් (මනනය) කළ යුතුව ඇති කොටස (පිරිමි හා ගැහැණු) දරුවන්ට හැදෑරීම පිණිස මස්ජිදයට ඇඳුණු ප්‍රාථමික පාසැලක් ලෙස **'මක්තබ්'** යන්න අර්ථ දැක්විය හැක. සමහරවිට කියවීම, ලිවීම හා අංකගණිතය වැනි විෂයයන් එහි විෂය ධාරාවට ඇතුළත් කොට ඇත."

මේ අනුව **'මක්තබ්'** යනු අන්තවාදී ආගමික මතවාදයන් හෝ වෙනත් සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා මුල් වී කටයුතු කරන මැතක දී අරඹන ලද ආයතනයක් නොවන බව දැඩි අවධාරණයකින් යුක්තව ප්‍රකාශ කරන්නට කැමැත්තෙමු.
එම සම්පූර්ණ ලිපිය පහත සඳහන් වෙබ් සම්බන්ධකයෙන් ලබා ගත හැක.
http://www.azeezfoundation.com/the-muslim-philosophy-of-education/

'අහදිය්යා' නමින් හැඳින්වෙන සති අන්ත දහම් පාසල් ද මස්ජිදයේ පවත්වාගෙන යනු ලැබේ. පෙර පාසල් ද පාසල් සිසුන්ගේ අමතර පන්ති පැවැත්වීම ද බොහෝ විට මස්ජිදයන්හි සිදු කරනු ලැබේ.



අහදිය්යා පාසලක පැවැත් වුනු සංස්කෘතික සංදර්ශනයක්

ඉහත කී දහම් පාසල් පූර්ණ විනිවිද භාවයකින් හා පූර්ණ නෛතික පදනමකින් යුක්තව මුස්ලිම් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොට ඔවුන්ගේ අනුමැතිය හා අනුග්‍රහය යටතේ අනුමත පොදු පාඨමාලාවක් අනුව පවත්වාගෙන යනු ලැබේ.

**අවුරුදු දහසක පමණ කාලයක සිට දරුවන්ගේ ආධ්‍යාත්මික වර්ධනය සඳහා මස්ජිදය හා බැඳී පවත්වාගෙන එනු ලබන මෙම දහම් පාසල් පිළිබඳව විරෝධතාවක් දක්වන්නේ නම් එය කෙතරම් සදාචාර සම්පන්න ක්‍රියාවක් දැයි විමසන්නට කැමැත්තෙමු.**

මාතෘ භූමියේ අනාගත පුරවැසියන් ලෙස වගකීම් දරන්නට ඉන්නා වර්තමාන දරු පරපුර ආගමික හෝ වාර්ගික භේදයකින් තොරව සාරධර්ම සපිරි යහ චර්යාවන්ගෙන් හෙබි යහ දරුවන් විය යුතුය යන්න අපගේ අවංක පැතුමයි. දරුවන්ට දහම් දැනුම ලබා දී ඔවුන්ගේ සාරධර්ම පෝෂණය සඳහා කටයුතු කරන ක්ෂේම භූමිය, දහම් පාසල් විනා අන් කුමක් විය හැකි දැයි අසන්නට කැමැත්තෙමු.


වැඩිහිටියන් සඳහා පැවැත්වෙන අධ්‍යාපනික වැඩසටහන්

වැඩිහිටි අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස ද මස්ජිදය කටයුතු කරයි. ඉස්ලාමීය විද්වතුන්ගේ දේශනා හා විවිධ පුහුණු කිරීම් වැඩ සටහන් මස්ජිදයේ පැවැත් වේ. මෙවන් අධ්‍යාපනික කටයුතු රාශියක් සිදුවන හෙයින් මස්ජිදය මුස්ලිම් වරයෙකුගේ ජීවිතයේ ඉතා වැදගත් ස්ථානයක් බවට පත්ව ඇත.

ඉහත සඳහන් සියලු කාර්යයන් මස්ජිදයේ ඉටු කිරීම සඳහා අනුමැතිය පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කොට ඇති වක්ෆ් සභාවේ ක්‍රියා පටිපාටියට අන්තර්ගතව ඇති බව ද සඳහන් කරන්නට කැමැත්තෙමු.

සදාචාර සම්පන්න යහ අනාගත පරපුරක් බිහි කිරීම සඳහා ආගමික අධ්‍යාපනය අත්‍යවශ්‍ය සාධකයක් බව පිළිගැනීමට දුෂ්කරතාවක් ඇත්තේ කාහට ද කියා අසන්නට කැමැත්තෙමු. ආගමික අධ්‍යාපනය නොලබා සාරධර්ම සපිරුණු සමාජයක් බිහි කළ හැක්කේ කෙසේ ද? අනාගත පරපුර රැක ගැනීමට මෙවන් දහම් පාසල් වලට දරුවන් යොමු කිරීම වැඩිහිටි අප කාගේත් වගකීම නොවේ ද? ලක්ෂ 5 ක් පමණ වූ වයස 5 හා 10 අතර මුස්ලිම් දරුවන්ට දහම් අධ්‍යපනය දෛනිකව ලබන්නට මස්ජිදය හැර විකල්පයක් තිබේ ද? කරුණාකර සිතා බලන්න.

## මස්ජිදය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

මස්ජිදයන් පිළිබඳ කටයුතු පාලනය වන්නේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නා ලද පනතකින් ලබා දී ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලවය. පළමුව එම පනතට අදාළ මූලික කරුණු විමසා 'මස්ජිද් නිර්මාණය, පරිපාලනය ආදී කරුණු පිළිබඳව සාකච්ඡා කරමු.

## මුස්ලිම් පල්ලි හා පුණ්‍යභාර හෝ වක්ෆ් පනත

මුස්ලිම් බැතිමතුන් තම ආගමික භක්තිය නිසා පුණ්‍ය කටයුතු සඳහා කරනු ලබන පරිත්‍යාග, පුණ්‍යභාර හෝ වක්ෆ් පුණ්‍යභාරයන්ට බැර කරනු ලැබේ. මෙම දේපල පිළිබඳ භෞතික අයිතිකරුවෙකු නොමැත. එමෙන්ම එම පරිත්‍යාග සදාකාලික ව පැවතිය යුතු වන්නේය. පුණ්‍යභාරයන්ට ලැබෙන දේපල හා සම්පත් විකිණීම හෝ අන්සතු කිරීම තහනම් ය.

**බෞද්ධ විහාරස්ථාන පරිපාලනය කිරීම සඳහා "බෞද්ධ විහාර හා දේවාලගම් පනත" තිබෙන්නාක් මෙන් මෙම මුස්ලිම් පුණ්‍යභාර අරමුදල් සඳහා දැනට වලංගුව පවතින්නේ 1956 අංක 51 දරණ "මුස්ලිම් පල්ලි සහ පුණ්‍යභාර හෝ වක්ෆ් පනතය".** එම පනත 1962 අංක 21 සහ 1982 අංක 33 දරණ පනත් වලින් සංශෝධනයට ලක්කර ඇත. වක්ෆ් මණ්ඩලය පත් කිරීම සිදු කරන්නේ රජය විසිනි. එය රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ. මුස්ලිම් පල්ලි හා පුණ්‍යභාර හෝ වක්ෆ් පනතේ වගකීම් පහත සඳහන් අයුරින් සංක්ෂිප්තව දැක්විය හැක.

1. මස්ජිද් නිර්මාණය සඳහා අනුමැතිය හා ලියා පදිංචිය
2. මස්ජිද් පරිපාලන කමිටු ලියා පදිංචි කිරීම හා එම කමිටු පිළිබඳ පරිපාලන වගකීම්
3. මස්ජිද් හි ගිණුම් කටයුතු පාලනය කිරීම
4. මුස්ලිම්වරුන්ගේ දිළිඳුකම අඩු කිරීමට ක්‍රියා කිරීම
5. මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම
6. මුස්ලිම්වරුන්ගේ යහපත සඳහා සුදුසු හා අවශ්‍යය යැයි තීන්දු කරන වෙනත් දෑ කිරීම
7. මුස්ලිම් නීතිය මගින් අනුමත කවර හෝ පුණ්‍ය ක්‍රියා සිදු කිරීම

## මස්ජිද් නිර්මාණය

මස්ජිදයක් නිර්මාණය කිරීමට දායක වීම ස්වර්ගයේ මාලිගාවක් ලැබීමේ භාග්‍ය අත් කරගත හැකි ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් ලෙස ඉස්ලාමය උගන්වයි. සමහර විට මස්ජිදයන් නිර්මාණය කිරීම සඳහා ප්‍රාදේශීය මෙන්ම ජාතික මට්ටමේ දායකත්වය ද ලැබේ.

අනෙකුත් සියලු දහම්වලට ඔවුන්ගේ ආගමික මධ්‍යස්ථාන නිර්මාණය හා පවත්වාගෙන යෑම සඳහා ජාත්‍යන්තරව මුදල් ආධාර ලැබෙන ආකාරයෙන්ම මතුලොව ලැබිය හැකි අති ශ්‍රේෂ්ඨ කුසල් අපේක්ෂාවෙන් ජාත්‍යන්තර මුස්ලිම් ප්‍රජාව ද මස්ජිද් නිර්මාණය කිරීම සඳහා දායක වීම දකින්නට ඇත. මස්ජිද්

නිර්මාණයේ දී මෙයට පෙර මස්ජිද් අතර දුර ප්‍රමාණය ගැන වැඩි සැලකිල්ලක් නොදක්වා ඇති බව සමහර තැන් නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන කරුණකි. වක්ෆ් මණ්ඩලය ප්‍රදේශයේ අවශ්‍යතාව මුල්කොට ගෙන නව මස්ජිද් ඉදි කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කොට ඇත. එමෙන්ම ජම්ඉය්යතුල් උලමා (සමස්ත ලංකා ඉස්ලාමීය විද්වතුන්ගේ සංගමය) ද මේ පිළිබඳව අවධානය යොමු කොට කටයුතු කරන හෙයින් මෙවන් ප්‍රශ්න ඉදිරියේදී මතු වීමට ඉඩකඩ කොහෙත්ම නොමැති බව දන්වන්නට කැමැත්තෙමු.

## මස්ජිද් පරිපාලනය

කාර්ය මණ්ඩල වැටුප් විදුලි හා ජල බිල්පත් ගොඩනැගිලි නඩත්තු වියදම් ආදිය මස්ජිදයේ සාමාජික පිරිසගේ මාසික දායකත්වය මගින් ගෙවනු ලැබේ. සෑම මස්ජිදයක් ම තම මුදල් ලැබීමේ හා වියදම් පිළිබඳව නිසි කළමනාකාරිත්වයකින් යුක්තව කටයුතු කිරීමට බැඳී ඇත.


දැනට යුනෙස්කෝ ලෝක උරුමයක්ව පවතින කොළඹ රතු පල්ලිය

පූර්ණ විනිවිද භාවයකින් යුක්තව පාර්ලිමේන්තුවේ සම්මත පනතක් අනුව සිදුවෙමින් පවතින මස්ජිද් පිළිබඳ කාර්යයන් කෙලෙස නම් නීති විරෝධී විය හැක්කේ ද? අපගේ මාතෘ භූමියේ ඉදිකරන ලද පළමු පල්ලිය ලෙස සැලකෙන බේරුවල අබ්රාර් පල්ලිය හා කොළඹ පිටකොටුවේ ඇති රතු පල්ලිය පෞරාණික වටිනාකමක් ඇති ලෝක උරුමයන් ලෙස යුනෙස්කෝ සංවිධානය විසින් නම් කොට ඇත.

## මස්ජිදය හා මුස්ලිම් සමාජය

ඉහත කරුණු සියල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේ දී අන් දහම් තම ආගමික ස්ථානය උපයෝගී කරගන්නා ප්‍රමාණයට වඩා ඉස්ලාමිකයින් හට මස්ජිදයේ බැඳියාව හා අවශ්‍යතාව ඉමහත් බව පෙනී යනු ඇත. එහෙයින් ජනගහන අනුපාතය අනුව එක් එක් දහම් සඳහා අවශ්‍ය ආගමික ස්ථාන පොදු සම්මතයක් අනුව තීන්දු කිරීම සාධාරණ එකක් නොවන බව පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු.

සලාතය ඉටු කිරීමේදි ඉහතින් විස්තර කළ පරිදි අනිවාර්යයෙන්ම කළ යුතු "සුජූද්" නමින් හැඳින්වෙන දණින් වැටී නළල බිම තබා ඉටු කරන ඉරියව්ව සඳහා එක් අයෙකුට වර්ග අඩි 2 x 4 = 8 ක් අවම වශයෙන් අවශ්‍ය වන්නේය. මේ අනුව 200 ක් වැනි කුඩා පිරිසක් නැමදුමට සහභාගී වන ස්ථානයක වුව ද ඉදි කළ යුතු මස්ජිද් ගොඩනැගිල්ලේ විශාලත්වය පිළිබඳව අපට අදහසක් ඇති කර ගැනීමට හැකි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු. මෙය නැමදුම් අවකාශ ප්‍රමාණය පිළිබඳ පමණක් වන අතර මේ හැර මස්ජිදයක තිබිය යුතු තවත් අංගයන් කිහිපයක් ඇත්තේය.

මස්ජිදයේ නැමදුම් කටයුතු මෙහෙයවන ඉමාම් වරයාට (ඉස්ලාමීය විද්වතාට) හා අවම වශයෙන් තවත් සේවකයින් දෙදෙනෙකුට නවාතැන් පහසුකම් සැලසීමට අවශ්‍ය ගොඩනැගිලි අවකාශයන් අනිවාර්යයෙන්ම මස්ජිදයක තිබිය යුතුය. මස්ජිදයේ විශාලත්වය අනුව සේවක පිරිස් සංඛ්‍යාව ද වැඩි විය හැක.



සලාතයට පෙර වුළූ ඉටුකිරීම

සලාතයට පෙර "වුළූ" නමින් හැඳින්වෙන දෝවනයක් අනිවාර්යයෙන්ම කළ යුතුව ඇති හෙයින් වැඩි ප්‍රමාදයකින් තොරව වැඩි පිරිසකට එක්වර මෙම කටයුත්ත කර ගැනීමට හැකිවන පරිදි ජලය සැපයීමේ ක්‍රම වේදයක් තිබිය යුතුය. මේ සඳහා ද විශාල ගොඩනැගිලි අවකාශයක් වෙන් කිරීමට සිදු වන්නේය.

සලාතයට සහභාගීවන පිරිසේ ප්‍රමාණය අනුව වැසිකිලි කැසිකිලි පහසුකම් ද මස්ජිදයේ තිබිය යුතුය. පරිපාලන කටයුතු සඳහා කාර්යාල පහසුකම් ද එහි තිබිය යුතු වන්නේය. ස්ත්‍රීන් සඳහා ද අවකාශයක් වෙන්කළ යුතු වන්නේය. මේ කරුණු සියල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේ දී කුඩා මුස්ලිම් ප්‍රජාවක් ජීවත්වන ප්‍රදේශයකට වුව ද අවශ්‍ය මස්ජිදයක ගොඩනැගිලි අවකාශය කෙතරම් ද යන්න අවබෝධ කර ගැනීමට හැකි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු.

ඉහත කරුණු සියල්ල සමස්තයක් ලෙස ගෙන සමාලෝචනය කිරීමේදී මුස්ලිම් සමාජයට මස්ජිදයක අවශ්‍යතාව කෙතරම් ද යන්න පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු. මස්ජිදය නිරතුරුව ධාර්මික හා සදාචාර සම්පන්න යහ පුරවැසියන් බිහි කිරීමේ ආගමික මධ්‍යස්ථානයක් විනා කිසිම ආකාරයක නීති විරෝධී හෝ සමාජ විරෝධී හෝ ක්‍රියාවන් සඳහා වූ මධ්‍යස්ථානයක් නොවන බව දැඩි අවධාරණයකින් යුක්තව ප්‍රකාශ කරන්නට කැමැත්තෙමු.

සාමයේ කේන්ද්‍ර ස්ථානයක් වූ මස්ජිදය පිළිබඳව තොරතුරු දැන ගැනීමේ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මස්ජිද් චාරිකා සූදානම් කර දිය හැක. බහු වාර්ගික හා බහු ආගමික සමාජයක එකිනෙකා පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇති කර ගැනීම සමාජ යහ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය කරුණක් ලෙස අපි සලකන්නෙමු. මස්ජිද් චාරිකාවකට එක්වීමෙන් මස්ජිදය මෙන්ම ඉස්ලාමීය ආගමික හා සංස්කෘතික කරුණු පිළිබඳව ද නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වේවි යැයි අපි අපේක්ෂා කරන්නෙමු. කරුණාකර අප සමඟ එක්වන්න. සත්‍යය තොරතුරු දැන ගැනීමේ දොරටුව ඔබ වෙනුවෙන් සදා විවෘතව ඇත. තවද මස්ජිද් වලට මුස්ලිම් නොවන අයව ගෙන්වා ගැනීම සඳහා මෙයට පෙර කටයුතු කරන්නට තිබුණා යැයි අපි නිහතමානීව පිළිගන්නෙමු. එහෙයින් එම වැරැද්ද නිවැරදි කර ගැනීමට අපි සැදී පැහැදී සිටින්නෙමු. සැකය අවිශ්වාසය තුරන් කර සියලු දේ දැන ගැනීමට අවශ්‍ය වටපිටාව සකස් කර දීමට අපි කැප වී කටයුතු කරන්නට සූදානමින් සිටින්නෙමු.

# ආගමික ස්ථාන පිළිබඳ ආගමික මතයන්

## ඉස්ලාමීය ඉගැන්වීම්

අන් ආගමික ස්ථාන පිළිබඳව ඇති ඉස්ලාමීය ඉගැන්වීම් දෙසට අපගේ අවධානය පළමුව යොමු කරමු. ඉස්ලාමීය ඉගැන්වීම් අනුව අන් ආගමික ස්ථාන සඳහා පූර්ණ නිදහස හා අයිතිය සහතික කොට ඇති බවට ඓතිහාසික ඉස්ලාමීය පාලන යුගයන් හි පැවති අනන්ත අප්‍රමාණ උදාහරණ ගෙන හැර දැක්විය හැක.

**මුහම්මද් නබි තුමාණන් මදිනාහ් නගරයට දේශාන්තරණය කිරීමෙන් පසු එම නගරයේ පාලකයා හැටියට ප්‍රමුඛතාවයක් දුන් කාර්යයක් වූයේ මිනිස් ඉතිහාසයේ ලේඛන ගත කළ පළමු මානව අයිතිවාසිකම් පිළිබඳ ව්‍යවස්ථාව සකස් කිරීමයි. මේ අනුව එම නගරයේ ජීවත් වූ කිතුනු යුදෙව් මෙන්ම පාරම්පරික දහම් ඇදහූවන්ගේ පරිපූර්ණ ආගමික අයිතිය සහතික කොට තිබිණි. මේ අනුව අන් ආගම් කෙරෙහි ඉස්ලාමය දක්වනුයේ සාමයික සහනශීලී පිළිවෙතක් බව සහතික වන්නේය. එමෙන්ම යුද තත්ත්වයක දී වුව ද අන් ආගමික ස්ථානයන්ට හා පූජක පක්ෂයට කිසිම ආකාරයක හානියක් ඇති කිරීම ඉස්ලාමය දැඩි ලෙස හෙළා දකින අතර ඒවා ආරක්ෂා කිරීම ඉස්ලාමිය හමුදාවෙහි ප්‍රධාන වගකීමක් ලෙස පවතී.**

මෙයට තවත් කදිම උදාහරණයක් වනුයේ ස්පාඤ්ඤයේ පැවැති අවුරුදු 800 ක් පමණ වූ ඉස්ලාමීය පාලනය යටතේ විසූ යුදෙව්වන් භුක්ති විඳි පූර්ණ ආගමික නිදහසයි. මේ අනුව ඔවුන්ගේ ආගමික දේවස්ථාන හා පූජක පක්ෂයේ ආරක්ෂාව මෙන්ම නැමදුම් කටයුතු නිදහසේ කර ගැනීමට අයිතිය සහතික කොට තිබිණි. මෙය යුදෙව් ජනයාගේ ස්වර්ණමය යුගය ලෙස යුදෙව් ඉතිහාසඥයින් විසින්ම හඳුන්වා දී ඇත.

අවාසනාවකට වාගේ වර්තමානයේ ආගම වැරදි ලෙස වටහා ගත් ඇතැම් අන්තවාදී කොටස් ඉස්ලාම් දහමේ ඉතා විශිෂ්ට ලෙස ප්‍රගුණ කොට ඇති සාමය සංහිඳියාව හා එකිනෙකාට ගරු කිරීමේ අන්‍යෝන්‍ය සුහදත්වය බිඳ දමා ම්ලේච්ඡ ලෙස හැසිරෙන බව සහ එමගින් ඉස්ලාම් දහම පිළිබඳව විකෘති චිත්‍රයක් මවා පා ඇති බව අපි නිහතමානීව පිළිගන්නෙමු.

එලෙසම අවාසනාවකට මෙන් එම කොටස් ඇත්ත වශයෙන්ම ඉස්ලාම් විරෝධී ඊශ්‍රායෙල් රජයේ "මොසාඩ් රහස් ඔත්තු සංවිධානය" සමග හා "ඇතැම් බටහිර ගැති මාධ්‍ය" සමග රහසිගත සබඳතා පවත්වා ගනිමින් ඉස්ලාම් දහම පිළිබඳව කුමන්ත්‍රණකාරී අයුරින් කටයුතු කරනවා ද යන මුස්ලිම් ජනයාගේ සැකය දැනට තහවුරු වෙමින් පවති.

එහෙත් වාසනාවකට මෙන් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනයා ඉතාම සාමකාමී ජනතාවක් වන අතර කිසිඳු අවස්ථාවක සංවිධාන ගත වී රටේ සාමයට හෝ රටේ භෞමික අඛණ්ඩතාවට බාධාවක් වන අයුරින් කටයුතු කොට නොමැති බව වගකීමෙන් යුක්තව පවසන්නට කැමැත්තෙමු.

## බෞද්ධ ඉගැන්වීම්

අන් ආගමික ස්ථාන හා ආගම් පිළිබඳ ව බුදුන් වහන්සේගේ පිළිවෙත විමසා බැලීම මෙම ලිපිය වඩාත් අර්ථවත් එකක් බවට පත් කර ගැනීමට උපකාරී වේ යැයි විශ්වාස කරන්නෙමු. මේ පිළිබඳව **ආචාර්ය එස්. අයි. ගමගේ මහතා** විසින් රචිත **"බෞද්ධ සමාජ දර්ශනය බෞද්ධ ඉතිහාසය සහ බෞද්ධ සංස්කෘතිය"** යන ග්‍රන්ථයෙන් පහත සඳහන් කොටස උපුටා දක්වන්නට කැමැත්තෙමු.

"බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වන පරිදි බුද්ධ කාලීන භාරත දේශයේ දෘෂ්ටි දෙසැටක් ව්‍යාප්ත වී පැවතුණේය. නමුත් බුදුන් වහන්සේ අන්‍යාගමික පැවිද්දන් හා ඔවුන්ගේ ඉගැන්වීම් හෙළා දැකීමට ඉදිරිපත් නොවූහ. එසේම ඕනෑම ආගමික ගුරුවරයෙකුගේ ඉගැන්වීම් වල ඇති යහපත් ගුණාංග බුදුන් වහන්සේ අගය කළහ.

බුදුන් වහන්සේ හැමවිටම අන්තර් ආගමික සහනශීලීතාවය ගරු කළහ. උන් වහන්සේ නොයෙක් ආගමික ගුරුවරුන් වෙත ගියහ. ඔවුන් සමඟ සතුටු සාමීචයෙහි යෙදී සිටියහ. ඇතැම් ආරාමවලට බුදු රදුන් වැඩම කරවූ අවස්ථාවේ ඒ ආගමික ගුරුවරු තම ශිෂ්‍යයින් නිහඬ කරවා උන්වහන්සේ ගෞරවයෙන් පිළිගත්හ. චූල සකුළුදායී පරිබ්‍රාජක ගුරුවරයා බුදුන් වහන්සේ තම ආරාමයට වැඩම කරනවා දැක සිය ශිෂ්‍ය පිරිස නිශ්ශබ්ද කරවීය. එසේම බුදුන් වහන්සේ වච්ඡගොත්ත පරිබ්‍රාජකයාගේ ආරාමයට ද වරින් වර වැඩම කළහ.

**ඕනෑම කෙනෙකුට ඕනෑම ආගමිකයෙකුට කවර වූ හෝ කාරණයක් උන් වහන්සේ පැහැදිලි කර දුන්නේ කාරුණිකත්වයෙන් යුක්තවය. උන් වහන්සේ කිසි විටෙකත් තම දේශනයෙන් අන්‍යයන් ප්‍රකෝපයට පත් නොකළහ. බුදුන් වහන්සේ ගේ ආගමික සහනශීලී තාවයෙන් පැහැදිලි වන්නේ කිසිම ආගමික සම්ප්‍රදායකට උන් වහන්සේ දොස් නොපැවරූ බවය. ඒ අනුව බුදුන් වහන්සේ සියලුම ආගමික දෘෂ්ටීන් කෙරෙහි දැක්වූයේ මිත්‍රශීලී සුහද ආකල්පයකි. ඒ ආකල්පය අද්‍යතන(වර්තමාන) යුගයේ ඒ ඒ ආගම්වල දෘෂ්ටි පක්ෂයත් ඒ ඒ ආගම් අදහන පොදු ජනතාවත් දරන්නේ නම් කිසිවිටෙකත් ආගම් පදනම් කර ගත් අර්බුද පැන නොනගිනු ඇත. බුදු සමය වැළඳ ගත් ධර්මාශෝක රජතුමා ආගම් පිළිබඳව අනුගමනය කළේ බුදුන් වහන්සේ දැරූ මෙම ආගමික සහනශීලී සංකල්පයයි."** (පිටු 98 - 101 දක්වා)

## සමාප්තිය

අප එකිනෙකාගේ ආගමික ස්ථාන පිළිබඳ විරෝධතා හා අවලාද නගමින් කටයුතු කරනවාට වඩා පළමුව සියලු ආගමිකයින්ට පොදු වූ සමාජ හා සදාචාර විරෝධී ආයතන පිළිබඳව සාමූහිකව අප සැම කටයුතු කළ යුතු නොවන්නේ ද? මෙයින් එක් උදාහරණයක් නම් දිනෙන් දින හතු පිපෙනවාක් මෙන් මතුවන මත්පැන් අලෙවි සැල්ය. **දළදා මන්දිරය පිහිටි මහනුවර ශුද්ධ භූමියේ පමණක් මත් පැන් අලෙවි සැල් 45 ක් ඇති බව දැනට දැනගන්නට ඇත. මෙයින් 9ක්ම දළදා වීදියේ හා ඒ අවට ප්‍රදේශයේ පිහිටා ඇත. අනුරාධපුර ශ්‍රී පාද**

ස්ථානය වැනි ආගමික භූමි අවට ද තත්ත්වය මෙයට දෙවැනි නොවේ. බලපත්‍ර ලාභී මත් පැන් සැල් 3332 ක් පමණ හා හොර මත් පැන් අලෙවි සැල් ලක්ෂ 2ක් පමණ අපගේ ධර්මද්වීපයේ ක්‍රියාත්මක බව සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි. සියලු ආගමික ස්ථාන එකතු කළ ද අපට මෙම මත්පැන් අලෙවි සැල් අබිබවා යෑමේ සංඛ්‍යාත්මක ශක්තියක් තිබේ ද යන්න කරුණාකර සිතා බලන්න. අපගේ සාමූහික උත්සාහය අන් අයගේ ආගමික ස්ථානවලට එරෙහිව යොදවන්නේ නැතිව සමාජ විරෝධී මෙවන් ආයතනවලට එරෙහිව යොදවන්නේ නම් සාරධර්ම සපිරි සදාචාර සම්පන්න යහ පරපුරක් බිහි කිරීමට උපකාරී වනවා නොවේ ද?

**බලපත්‍ර ලාභී මත් පැන් සැල් 3332 ක් පමණ හා හොර මත් පැන් අලෙවි සැල් ලක්ෂ 2ක් පමණ අපගේ ධර්මද්වීපයේ ක්‍රියාත්මක බව සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි.**




සෑම දහමක්ම කටයුතු කරන්නේ සදාචාර සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම අරමුණු කොට ගෙනය. මෙම මූලික අදහස මත පිහිටා දහම් අතරේ විවේචන සඳහා අපගේ ශක්තිය හා හැකියාවන් නාස්ති නොකොට මුළු සමාජයේම සාරධර්ම පිරිහීමට හේතු සාධක වන කරුණු කෙරෙහි අපගේ සාමූහික අවධානය යොමු කරමින් ඔවුනොවුන්ගේ ආගමික අවශ්‍යතාවන් කෙරෙහි වැටහීමකින් යුක්තව ආගම් අතර සාමයික සංහිඳියාව ඇති කිරීමට කටයුතු කිරීමට ඉදිරිපත් වීම වඩාත් යෝග්‍ය ක්‍රියාවක් බව අපි දකින්නෙමු.

අන්‍යෝන්‍ය අවබෝධය ගොඩ නැගීම පදනම් කරගෙන සකස් කෙරෙන මෙම "සමාජ සංවාද" ලිපි පෙළෙන් අප අපේක්ෂා කරන්නේ ශ්‍රී ලාංකේය සැමට සුහදත්වය සාමය හා සහෝදරත්වයෙන් සපිරි අලංකාර සමාජ පරිසරයක් ගොඩ නැගීමටය. මෙම උදාර අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම පිණිස කරුණාකර අප සමඟ අත්වැල් බැඳ ගන්නා ලෙස ගෞරව පූර්වකව ආරාධනා කරන්නෙමු.